# <u>බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව.</u>

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2008.08.28

වේලාව : පෙ.ව.10.30

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

<u>සහභාගීත්වය:-</u>

01. ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා
02. ගරු උපසභාපති - සුමේද චමින්ද බස්නායක මැතිතුමා
03. ගරු නගර සභා මන්ත්‍රී- ධර්මසේන සමරසිංහ මැතිතුමා.
04. ගරු නගර සභා මන්ත්‍රී- ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා
05. ගරු නගර සභා මන්ත්‍රී- ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා
06. ගරු නගර සභා මන්ත්‍රී- එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
07. ගරු නගර සභා මන්ත්‍රී- විමලසේන වැවේගෙදර මැතිතුමා.
08. ගරු නගර සභා මන්ත්‍රී- එම්.ටී.එම්.රූමි මැතිතුමා

<u>නිලධාරී සහභාගීත්වය:-</u>

01. නාගරික ලේකම් - ආර්.ඩී.නලීන් පුෂ්ප කුමාර මහතා

<u>සහභාගීනොවූවෝ:-</u>

01. ගරු නගර සභා මන්ත්‍රී - යූ.එච්.ගාමිණී මැතිතුමා

(01) <u>ආගම සිහිකිරීම:</u>

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) <u>ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:</u>

ගරු සභාපතිතුමා කථා කරමින්, අද දින පැවැත්වෙන සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු උපසභාපතිතුමා , ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා,ලේකම්තුමා හා පුවත්පත්කලාවේදී මහතුන් ගරු සභාපතිතුමා විසින් සාදරයෙන් පිළිගන්නා ලදී. ඉන් අනතුරුව අදහස් දැක් වූ එතුමා, අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක වන ජාතික සවිය,

ගම නැගම මග නැගම වැනි සංවර්ධන වැඩ සටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරවමින්, රටේ සංවර්ධනය ක්‍රියාවලිය ඉතා සාර්කව කරගෙන යන අතර තිරසාර සාමයක් ඇතිකිරීමේ උදාර කර්තෘවයෙහි ද රජය මේ අවස්ථාවේ නිරතව සිටින බවත් දැන්වීය. සබරගමුව හා උතුරු මැද පළාත් සභා මැතිවරණයේ දී සියළුම ආසන වල බලය එක්සත් ජනතා සංධානය වෙත ලබාදෙමින් එක්සත් ජනතා සංධානයට අති විශිෂ්ඨ ජයක් ලබාදීමට ජනතාව ක්‍රියාකල බවත්, ඒතුලින් අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වය , එතුමාගේ වැඩ පිළිවෙල ජනතාව ඉතා අගය කර ඇති බව මනාව පැහැදිලි වන්නේ යැයි පැවසීය. එක්සත් ජනතා සංධානය ජයග්‍රහණය කරවීම සම්බන්ධව සබරගමුව හා උතුරු මැද පළාත් සභාවල ජනතාවට ස්තුතිය මේ අවස්ථාවේ දී පළකර සිටින බව දැන්වීය.

තව දුරටත් කථා කළ ගරු සභාපතිතුමා, පසුගිය දා පැවැති සබරගමුව හා උතුරු මැද පළාත් සභා මැතිවරණයේ දී ජන්දදායකයින්ට ජන්දය පාවිච්චි කිරීමට සිය අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැදුනුම්පත අනිවාර්යය කර තිබුණු බවත්, එමගින් දුෂණ වංචා වලින් තොර ඉතා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට හැකි වූ බවත්, එවැනි පියවරක් ගැනීම සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාට හා රජයට සිය ස්තුතිය පුදකර සිටින බවත් දැන්වීය. සබරගමු පළාත් සභාවේ හිටපු පළාත් පාලන ,පළාත් මාර්ග,පරිසර,සංචාරක,සමුපකාර හා වෙළඳ අමාත්‍ය, බලන්ගොඩ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ප්‍රධාන සංවිධායක මොහාන් එල්ලාවල මැතිතුමා බලන්ගොඩ ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් විශාල වශයෙන් මුල්‍යමය දායකත්වය ලබාදෙමින් සංවර්ධන කටයුතු ඉටුකිරීමට අවශ්‍ය සහයෝගය ලබාදුන් බව පැවසීය. මෙම නගර සභාවට ද අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙමින් විශාල සහයෝගයක් ලබාදුන් බව මෙම අවස්ථාවේ දී කෘතවේදීව සිහිපත් කර අතර, මෙවර පළාත් සභා මැතිවරණයේ දී එතුමාට ලැබුණු මනාප ප්‍රතිශතය අනුව ලැබී ඇත්තේ 04 වන ස්ථානය බවත්, එම හේතුව නිසා, අමාත්‍යධුරයක් ලබාගැනීමේ අවස්ථාව ගිලිහිගොස් තිබෙන බව දැනගැනීමට ඇති බවත්, නමුත්, එතුමාට පළාත් සභාවේ උත්තරීතර පදවිය වන ගරු ආණ්ඩුකාර පදවිය ලබාදෙන බව දැනගැනීමට ලැබී ඇති බවත්, ඒ සම්බන්ධව සභාවේ සතුට පළකර සිටින බව දැන්වීය.

ජාතික සවිය ගම නැගුම වැඩ සටහන යටතේ, මහා මාර්ග අමාත්‍යාංශයෙන් ලක්ෂ 50 ක මුදලක් මෙම සභාව වෙත වෙන්කර එවා ඇති අතර, සෘජු කම්කරු ශ්‍රමය යටතේ වැඩ ආරම්භ කිරීමට ඉදිරියේ දී කටයුතු කරන බවත්, ඉරිදා සතිපොළ ඉදිකිරීමේ කර්මාන්තය ලබන මස තුළදී ටෙන්ඩර් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමින්, සභාවේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට ලේකම් මහතාට ආරාධනය කරන ලදී.

(03). **2008.07.31 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2008.07.31 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

(04) **පසුගිය වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවිය.

(05) **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **බළන්ගොඩ නව බස්නැවතුම්පල පරිශ්‍රය සඳහා අමතර මුරකරුවකු යොදාගැනීම:**

උක්ත හිසින් යුතුව, බලන්ගොඩ,පෙට්ටිගල පාර අංක: 145 දරණ ලිපිනයේ පදිංචි ඩබ්.ඒ.සේනක යන අය විසින් ඉදිරිපත් කර ඇති 2008.08.18 දිනැති ලිපිය සභාගත කරන ලදී.

තමා බලන්ගොඩ බස්නැවතුම්පල පරිශ්‍රයේ දැනට වසර දෙකක පමණ සිට මුරකරුවෙකු ලෙස සේවය කරන අතර, විශාල කඩ සාප්පු සංකීර්ණයකින් යුතු මෙම ස්ථානයේ තනිවම සේවය කිරීමේ අපහසුතාවයක් පැන නැඟී ඇති බවත්, පසුගිය දිනක සොරුන් විසින් කඩ කාමරයක් කැඩීමට උත්සාහ කල බවත්, එබැවින්, මෙහි තනිවම සේවය කිරීම අනතුරුදායක බවත් සඳහන් කරමින්, තවත් මුරකරුවකුගේ සේවය ලබාදෙන ලෙස මගින් ඉල්ලීමක් කර තිබිණ.

මේ සම්බන්ධව සාකච්ඡා කල සභාව, පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන මෙම ස්ථානයට තවත් මුරකරුවකු යෙදවීමට තීරණය කරන ලදී.

05:02 **බෝම්බුව ක්‍රීඩාපිටියේ ආරක්ෂක දැල සකස් කරදෙන ලෙස ඉල්ලාසිටීම:**

ඉහත සඳහන් කාරණයට අදාළව , බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් විසින් එවා ඇති 2008.08.21 දිනැති ලිපිය සභාගත කරන ලදී.

බෝම්බුව ක්‍රීඩාපිටියේ ආරක්ෂක දැල දිරාපත්ව ඇති නිසා එහි ළමුන් ක්‍රීඩා කරන විට පන්දුව නිවසට යොමුවීම නිසා නිවසේ දොර ජනෙල් හා විදුලි බල්බ වලට හානි සිදුවන බවත්, එම නිසා දිරාපත් වූ එම දැල ඉවත් කර නව ආරක්ෂිත දැලක් යොදන ලෙස , බලන්ගොඩ, පෙට්ටිගල පාර අංක: 140 දරණ ලිපිනයේ පදිංචි ජී.ඩී.සුමනසිංහ යන අය විසින් තමාගෙන් ඉල්ලීමක්

කර ඇති බව සඳහන් කරමින් , ඒ සම්බන්ධව සොයා බලා අවශ්‍ය කටයුතු කරන ලෙස එමගින් දන්වා තිබිණ.

නව ආරක්ෂිත දැලක් සභාව මගින් මිළදි ගෙන ලබාදීමට තිරණය කරන ලදී.

05:03 <u>2008.05.30 දින පැවැති මහ සභාවේ අංක: 5:22 තීරණයට සංශෝධිත යෝජනා:</u>

ඉහත කාරණයට අදාළව විෂය භාර නිලධාරිණිය විසින් ඉදිරිපත් කර ඇති 2008.08.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

වරිපනම් බදුවල සියළුම හිඟ මුදල් කාර්යාලය වෙත ලැබුණු පසු පමණක් කොමිස් මුදල් ගෙවීමට 2008.05.30 දින පැවැති මහ සභාවේ දී තිරණය කර ඇති අතර, මුළු හිඟ මුදලම එකවර අයකරගත නොහැකි වන අතර, එය කොටස් වශයෙන් අයකරගත හැකි බව පෙනෙන බවත්, 2007.12.31 දින වන විට හිඟ ශේෂය රු.2817454.56 ක් වූ අතර, ඉන් 2008.07.31 දින වන විට රු.1066609.69 ක් අයකර තිබෙන බවත්, එබැවින්, 2008.07.31 දින වන විට හිඟ මුදලින් 38% අය වී ඇති බැවින්, එම මුදලට අදාළව කොමිස් මුදල ගෙවීම සඳහා උපදෙස් ලබාදෙන ලෙස ඉල්ලා තිබිණ.

එකතු කරන ලද හිඟ මුදල් සඳහා කොමිස් මුදල නොවැම්බර් මාසයේ ගෙවීම සුදුසු බවට තිරණය කරන ලදී.

05:04 <u>නිවාඩු අනුමත කරගැනීම- ගරු නාගරික මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:</u>

අසනීප තත්ත්වයෙන් පසුවන නිසා 2008.08.28 වන දින පැවැත්වෙන මහ සභා රැස්වීමට සහභාගිවිය නොහැකි බවත්, එබැවින්, එදිනට නිවාඩු අනුමත කරදෙන ලෙස ඉල්ලා ගරු නාගරික මන්ත්‍රී,ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, නිවාඩු අනුමත කිරීමට සභාව තිරණය කරන ලදි.

05:05 <u>ඔප්පුව ලබාදෙන ලෙස ඉල්ලා සිටිම:</u>

බළන්ගොඩ,රාස්සගල පාර සුදර්ශනම නිවාස යෝජනා ක්‍රමයේ අංක: 76/40 දරණ නිවස සඳහා මේ දක්වා ඔප්පුව ලබාගෙන නොමැති බවත්, එය ලබාදෙන ලෙස ඉල්ලමින්, එම්.එච්.කුසුමාවති , යන අය විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී. මෙම අයගේ ස්වාමීපුරුෂයා මියගොස් ඇති බැවින්, නීත්‍යානුකුල ආකාරයට ඔහුගේ බිරිඳට මෙම දේපලෙහි බදු අයිතිය ලබාදීමට තිරණය කරන ලදී.

- අත්‍යාවශ්‍ය රාජකාරි කටයුත්තක් සඳහා තමා සභාවෙන් බැහැර යන බව පවසමින් ,සභාවේ මුලාසනයේ කටයුතු ඉටුකරන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ඊ.ජී.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා වෙත ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.
-

05:06 <u>බලන්ගොඩ බස්නැවතුම්පලේ කඩ කාමර අංක: සී.42 සහ 43 ආරක්ෂාව සම්බන්ධවයි:</u>

බලන්ගොඩ බස්නැවතුම්පලේ කඩ කාමර වල ආරක්ෂාව තහවුරු කිරීමටත්,පවිත්‍රාව රැකගැනීමටත් අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමින්, කේ.වයි.සම්පත් යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදුව, අතිරේක මුරකරුවකු යෙදවීමට තීරණය කර ඇති බව දන්වා යැවීමට තීරණය විය.

05:07 <u>තාවකාලික රියදුරෙක් ලබාගැනීම:</u>

බලන්ගොඩ නගර සභාවේ සභාපති වශයෙන් සේවය කරන තමා හට රාජකාරී රැසක් ඉටුකිරීමට සිදුව තිබෙන නිසා දිවා හා රාත්‍රී කාලයේ දී එකී රාජකාරී කටයුතු ඉටුකරනු ලබන බවත්, දිවා කාලයේ රාජකාරී කටයුතු සඳහා යොදවා ගනු ලබන රියදුරු මහතා රාත්‍රී කාලයේ ද සේවය සඳහා යොදවා ගැනීමට නොහැකිව තිබෙන බවත්, තමා ද අසනීප තත්ත්වයේ පසුවන නිසා, වාහන ධාවනය කිරීම ශරීර සෞඛ්‍යයට අහිතකර බව වෛද්‍යවරුන් විසින් දන්වා තිබෙන බවත්, එබැවින්, අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු වලදී හා නිවාඩු දිනවලදී පමණක් සේවයේ යොදවා ගැනීමට අතිරේක රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කරමින් ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගෙන නිවාඩු දිනවල හා අත්‍යාවශ්‍ය රාජකාරී කටයුතු යෙදෙන අවස්ථාවල දී පමණක් සේවයට යොදවා ගැනීමට අතිරේක රියදුරෙකු බඳවා ගැනීම සුදුසු බවට සභාව තීරණය කරන ලදී.

05:08 <u>ජාතික සවිය - ගම නැගුම 2008</u>
<u>කුමාරගම ග්‍රාම නිලධාරී වසම:</u>

බලන්ගොඩ නගර සභාව වෙත අනුඥාත කරන ලද " කල්තොට පාර කුමාරගම පාර කොන්ක්‍රීට් කිරීම" ව්‍යාපෘතිය ප්‍රමාණවත් ප්‍රජා දායකත්වයක් ලබාදීමට අදාල ප්‍රතිලාභීන් ප්‍රතික්ෂේප කරන නිසාවෙන් හා ඒ වන විටත් වැඩ ආරම්භ නොකිරීම නිසාවෙන් අවලංගු කිරීමට කටයුතු කරන ලෙස ගරු විෂය භාර අමාත්‍යතුමා විසින් උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව, "කල්තොට පාර කුමාරගම දෙවන පටුමග කොන්ක්‍රීට් කිරීම " ව්‍යාපෘතිය සඳහා වූ අනුඥාත නිවේදනය අවලංගු කරන බවත්, 2008.08.10 දින ගරු අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද නව ව්‍යාපෘතිය ප්‍රාදේශීය සභාවට අයත් බැවින්,

ඇස්තමේන්තු සකස් කිරීම සඳහා එම ආයතනය වෙත දන්වා ඇති බව සඳහන් කරමින් ප්‍රාදේශීය ලේකම්, බලන්ගොඩ විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදුව, කීනගහඇල්ල පාර සකස් කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරීමට සභාව තීරණය විය.

05:09 **<u>හිග වරිපනම් බදු අයකිරීම:</u>**

හිඟ වරිපනම් බදු අයකිරීම සඳහා ආදායම් අංශයේ හා කාර්යාලයේ අනෙකුත් සේවක මහත්ම මහත්මීන් යෙදවීම පිළිබඳව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ආදායම් අංශයේ හා කාර්යාලයේ අනෙකුත් සේවක මහත්ම මහත්මීන් රාජකාරි වේලාවෙන් බාහිරව හා නිවාඩු දිනවල එකතු කරනු ලබන හිඟ මුදල් සඳහා 10% කොමිස් ගෙවීමේ පදනම මත යෙදවීමට තීරණය කරන ලද අතර, හිඟ මුදල් සියල්ල අයකරගැනීමෙන් පසුව අදාල කොමිස් ගෙවීම සුදුසු බව වැඩිදුරටත් තීරණය කරන ලදී.

06. **<u>මුදල් ගෙවීම් අනුමත කිරීම:</u>** රු. 10000/- ට වැඩි ගෙවීම්:

01. ජනශක්ති රක්ෂණ සමාගම
ජේ.සී.බී.යන්ත්‍රය රක්ෂණය කිරීම රු. 57543.52

02. සාමාන්‍යාධිකාරී
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.01 සිට 2008.07.10 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 79634.00

03. සාමාන්‍යාධිකාරී
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.10 සිට 2008.07.14 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 33464.80

04. කලර් බැන්ක්- නිහාල් ට්‍රේඩින් කම්පැණි
දන්සල සඳහා පොදු වෙළඳසැලට තීන්ත
ලබාගැනීම රු. 45739.98

05. ප්‍රියංවදා එන්ටර්ප්‍රයිසස්
සෞඛ්‍ය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 24601.50

06. ජොන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට්
ලිමිටඩ්, මල්ඩිම්ඩියා ප්‍රොජෙක්ටර්
එකක් මිලදී ගැනිම රු. 116522.40

07. පුරණි ඉන්ස්පිරේෂන් ප්‍රයිවට් ලිමිටඩ්
නගර සභා නිල වෙබ් අඩවියේ ඩොමේන් රෙජිස්ට්‍රේෂන්
හා වෙබ් හොස්ටින් සම්බන්ධතාවය ජුලි මස සිට
ඉදිරි වසර සඳහා ලබාගැනීම රු. 10396.00

08. ටොයෝටා ලංකා පුද්ගලික සමාගම
එන්.ඩී.5124 වැන් රථය සේවය කිරීම හා
සේවා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 94494.93

09. සෙනෙවිරත්න ස්ටෝර්ස්
නගර සභා ලේකම් නිල නිවසේ මුළුතැන්ගෙය
සඳහා අවශ්‍ය උපකරණ මිළදී ගැනීම රු. 10587.00

10. ජයන්ති ටයර් සෙන්ටර්
ටිපර් රථයට 700X16 සිල්වර්ස් ටයර් දෙකක්
මිලදී ගැනීම රු. 19600.00

11. ජයන්ති ටයර් සෙන්ටර්
කෲ කැබ් රථයට හා 8952 ට්‍රැක්ටරයට බැටරි
දෙකක් මිළදී ගැනීම රු. 29000.00

12. දැන්වීම් කළමණාකරු
එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම
කසල බද්ද පිළිබඳ දැන්වීමක් පළකිරීම රු. 11643.75

13. එස්ලෝන් ලංකා පුද්ගලික සමාගම
කර්මාන්තය අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 16008.00

14. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
2008 මැයි මස දුරකථන බිල්පත් පියවීම
දු.අ.87275/87153/86596 රු. 17212.64

15. දේශීය ආදායම් කොමසාරිස්
2008 අප්‍රේල්/මැයි රඳවා ගැනීමේ බදු මුදල් ගෙවීම රු. 65397.70

16. දේශීය ආදායම් කොමසාරිස්
2008 ජුනි මස වැට් බදු ගෙවීම රු. 158613.00

17. සභාපති,
සුහද ග්‍රාම සංවර්ධන සමිතිය.
එපිටපැත්ත අස්සැද්දුම දක්වා මාර්ගය කොන්ක්‍රීට්
කිරීම කර්මාන්තයේ පළමු කොටස් මුදල ගෙවීම රු. 290370.39

18. ජගත් එන්ටර්ප්‍රයිසස්
සිමෙන්ති මිටි 50 ක් , මුදුන් උළු හා පී.වී.සී.දොරක්
සඳහා මුදල් ගෙවීම. රු. 46365.00

19. බී.ගුණරත්න
2008.07.15 සිට 2008.07.31 දක්වා නගරයේ කැලි
කසල ඉවත් කිරීම සඳහා වු මුදල් ගෙවීම රු. 86500.00

20. ආනන්ද හාඩ්වෙයාර්
සිමෙන්ති මිටි 25 ක් සැපයීම රු. 20100.00

21. විජිත ගල් කැටයම්
නව සතිපොල පිවිසුම් මාර්ගයේ
සමරුඵකය සඳහා මුදල් ගෙවීම රු. 19000.00

22. සාමාන්‍යාධිකාරී
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.14 සිට 2008.07.16 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු.31911.50

23. පළාත් ආදායම් කොමසාරිස්
රැඳවුම් බදු මුදල් ගෙවීම රු. 18581.89

24. සභාපති,
සිරිවිජය ග්‍රාම සංවර්ධන සමිතිය
සුදර්ශනගම 1 පටුගම වම්පස මාර්ගය කොන්ක්‍රීට් කර
පැති බැම් බැඳ සංවර්ධනය කිරීම කර්මාන්තයේ
10% රැඳවුම් ගෙවීම රු. 76446.38

25. ජයන්ති ටයර් සෙන්ටර්
ගලී බවුසරයට 700X16 ටයර් 04 ක් මිලදී ගැනීම රු. 44000.00

26. සභාපති,
තලංගම පැරකුම් ගොවි සංවිධානය
ඇල්ලෙපොල,මාලිගාතැන්න කඩය අසලින්

ඉහල පාර සරස්වතීවත්ත පාරට සම්බන්ධ පාර
කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයේ අවසන් ගෙවීම රු. 345500.00

27. ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්
දුරකථන බිල්පත් පියවීම.
දු.අ. 2287022/ 2287024/2288400/060-2452931
060-2452932-2008 මැයි
2288565-2008 ජනවාරි-මාර්තු රු.14534.39

28. ජයන්ති ටයර් සෙන්ටර්
අංක:01 ජල බවුසරයට 750X16 ටයර් දෙකක්
මිලදී ගැනීම රු. 21336.00

29. ජෝති ස්ටෝර්ස් කාර්යාලීය කටයුතු සඳහා
අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම රු. 45798.80

30. ඊ.ජී.චන්ද්‍රරත්න මයා
පොහොර කිලෝ 10000 ක් හැලීම වෙනුවෙන්
මුදල් ගෙවීම. රු. 10000.00

31. ඩී.ආර්.මැනිෆැක්චරින් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්
ඇඳි පුටු 12 ක් මිළදී ගැනීම රු. 47481.00

32. නිව් මල්ලිකා ගොවිසේවා
සෞඛ්‍ය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය මිළදී ගැනීම රු. 20864.25

33. ඒ.එච්.කේ.ආර්.චමින්ද
කියවීම් ශාලාව සකස් කිරීම කර්මාන්තයේ ඩෙක්ස්
පුටු සැදීම සඳහා දෙවන අත්තිකාරම් මුදලක් ගෙවීම රු. 20000.00

34. සී.ස.ජනශක්ති රක්ෂණ සමාගම
226-7521 ටිපර් රථය රක්ෂණය කිරීම රු.15081.87

35. එල්.ඊ.සී.සී.මෙටල් කෂර්
4X4 ගල් කියුබ් 15 ක් මිලදී ගැනීම රු. 60066.00

36. එම්.ජී.පියසේන
තැන්පත් මුදල ආපසු ගෙවීම. රු. 20000.00

37. සභාපති,
නාගරික සමෘද්ධි බලකාය
බලන්ගොඩ සිටි ගාර්ඩන්ස් පාර කොන්ක්‍රීට් කිරීම
කර්මාන්තයේ 20% ක් අත්තිකාරම් මුදල ගෙවීම රු. 100000.00

38. එච්.ජී.ප්‍රදීප් කුමාර දිසානායක
නොරතුරු මධ්‍යස්ථානයට අවශ්‍ය මේස 08 ක්
අල්මාරි 01 ක්,කබඩ් 01 ක් , රවුම් මේස 01 ක්
මිළදි ගැනීම හා ප්‍රවාහන ගාස්තු ගෙවීම රු. 135684.30

39. ඊ.ජී.චන්ද්‍රරත්න
පොහොර කිලෝ 10000 ක් හැලීම වෙනුවෙන් ගාස්තු
ගෙවීම. රු. 10000.00

40. සාමාන්‍යාධිකාරි
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.24 සිට 2008.07.31දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 103329.30

41. සාමාන්‍යාධිකාරි
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.11 සිට 2008.07.23 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 96675.00

42 සාමාන්‍යාධිකාරි
සී/ස.ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය
2008.07.31 සිට 2008.08.07 දක්වා
ඉන්ධන බිල්පත් පියවීම. රු. 86687.50

43. ලංකා බැංකු ගිණුම
දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්
වැට් බදු මුදල් ගෙවීම. රු. 68631.00

මෙම මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

07. <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම:</u>

ඇස්තමේන්තු කිසිවක් ඉදිරිපත් නොවිය.

08.1 <u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ</u> : නැත

11.<u>යථා පරිදි කල් දී ඇති යෝජනා:</u> නැත

09. <u>ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම</u>:
නැත

10. <u>යෝජනා</u>

10:01 වැවේගෙදර මාර්ගයේ පැති බැම්ම හා පල්ලෙකුඹුර පාර පැති බැම්ම ඉදිකිරීමට ගරු නගර සභා මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු නගර සභා මන්ත්‍රී ධර්මසේන සමරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

10:02 කුමාරගම අවට හා පන්සල අවට ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදීම සඳහා ප්ලාස්ටිසෙල් ජල ටැංකියක් හා ජල මෝටරයක් හා බට ලබාදෙන ලෙස ගරු නගර සභා මන්ත්‍රී ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් යෝජනා කරන ලදුව, එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. <u>කාරක සභා වල වාර්තා සලකා බැලීම</u>:

2008.08.06 වන දින පවත්වන ලද කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදුව, එම වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12. <u>ආදායම් වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත්කිරිම:</u>

2008 ජුලි මාසයට අදාල ආදායම් හා වියදම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්තන ගෙවීම් | රු. 2819866.61 |
| වෙනත් ලැබීම් | 1070052.00 |
| | ----------- |
| මුළු ලැබීම් | 3889918.61 |
| | ======== |
| ගෙවීම්-2008 ජුලි | |
| පුනරාවර්ථන ගෙවීම් | 2435260.76 |
| ප්‍රාග්ධන ගෙවීම් | - |
| වෙනත් ගෙවීම් | 973364.13 |
| | ---------- |
| මුළු ගෙවීම් | 3408624.89 |
| | ======== |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් ඒකමතිකව අනුමත කරන ලදී.

14. **වෙනත් කරුණු:-**

14:01 **ගරු නාගරික මන්ත්‍රී - එම්.ටී.එම්.රුමී මැතිතුමා:**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින්,සබරගමුව හා උතුරු මැද පළාත් සභා දෙකෙහි බලය එක්සත් ජනතා සංධානය වෙත ලබාදීම සම්බන්ධව එම පළාත් සභා දෙකෙහි ජනතාව වෙත තමාගේ ස්තුතිය පිරිනමන බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා, තමා මෙවර සබරගමුව පළාත් සභා මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු ඉදිරිපත් වූ අතර, ජන්ද 3989 ක් ලබාගැනීමට හැකි වූ බවත්, ඒ සම්බන්ධව ,රත්නපුර හා බලන්ගොඩ ප්‍රදේශයේ ජනතාවට තමාගේ ස්තුතිය පිරිනමන බව දැන්වීය.

15. **අවසානය:**

**ගරු නගර සභා මන්ත්‍රී,ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා:**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටත්,ලේකම් මහතාටත් සිය ස්තුතිය පුදකරමින්, ප.ව.12.00 ට පමණ රැස්වීමේ වැඩ කටයුතු අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බලන්ගොඩ නගර සභාව.